සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-සති පාසල

සැකසුම:-ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

8 ශ්‍රේණිය -සිංහල | දෙවන වාරය | පස් වන සතිය

## 08 ප්‍රායෝගික ලේඛන - දැන්වීම් පත්‍ර

- විවිධ කරුණු සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීම සඳහා ප්‍රබල ප්‍රචාරණ උපක්‍රමයක් ලෙස දැන්වීම් භාවිත කළ හැකිය.
- දැන්වීම් පත්‍රයක:-
  1. කරුණු නිවැරදිව හා පැහැදිලිව දැක්වීම.
  2. සංක්ෂිප්ත භාවය හා ආකර්ෂණීය භාවය.
  3. සරල බව ආදිය අනිවාර්ය ලක්ෂණ වේ.
- දැන්වීම් පත්‍රයක පොදු ආකෘතිය:-
  1. සිත් ගන්නා සුළු මාතෘකාවක් යෙදීම.
  2. දැනුම් දිය යුතු අත්‍යවශ්‍ය කරුණු අවධාරණය කිරීම.
  3. දැන්වීම කරන්නේ කවුරුන්දැයි අවසානයේ සඳහන් කිරීම.
  4. සිත් ලන්නා සුළු ආකෘතියක් යොදා ගැනීම.
  5. දිනය , ස්ථානය , වේලාව , මාතෘකාව ආදිය කැපී පෙනෙන ලෙස යෙදීම.
  6. අත්‍යවශ්‍ය කරුණු සියල්ල ම සාරාංශ කර ඉදිරිපත් කිරීම.

ක්‍රියාකරකම්:- ඉහත කරුණ කෙරෙහි අවධානය යොමු කරමින් පහත සඳහන් කාරනා සම්බන්ධයෙන් ජනතාව දැනුවත් කිරීමට දැන්වීම් පත්‍ර නිර්මාණය කරන්න.

1. ලේ දන් දීමේ කඳවුරක් පැවැත්වීම පිළිබඳව ප්‍රදේශවාසීන් දැනුවත් කිරීමට
2. කොරෝනා උවදුරෙන් ප්‍රදේශවාසීන් මුදවා ගැනීම සඳහා ජනතාව දැනුවත් කිරීමට